10 - ශ්‍රේණිය 2021 වසර

ජනවාරි 4 සතිය

# චිත්‍ර කලාව කාර්ය පත්‍රිකාව

7.1.1 පාඩම ඇසුරින්

කාලච්ඡේද 01

**ගඩලාදෙණි විහාරය**

**නිපුණතා මට්ටම**

- ගඩලාදෙණි විහාරයේ ගෘහ නිර්මාණ මූර්ති කැටයම් නම් කරයි.
- ගඩලාදෙණි විහාරයේ නිර්මාණවල ඓතිහාසික පසුබිම ගවේෂණය කරයි.
- නිර්මාණාත්මක ශෛලිය සඳහා පදනම් වූ මාධ්‍ය හා ශිල්ප ක්‍රම විස්තර කරයි.
- ගෘහ නිර්මාණ ඇතුලු කලා අංශවල කලා ලක්ෂණ ඇගයීමට ලක් කරයි.

**ඉගෙනුම් අත්වැල**

- ක්‍රිස්තු වර්ෂ 1341 - 1351 කාලයට අයත් ගඩලාදෙණි විහාරය සද්ධර්මතිලක විහාරය නමින් ද හැඳින් වේ.
- ගම්පොළ යුගයට අයත් සුවිශේෂී නිර්මාණයක් වන මෙය හතරවන බුවනෙකබාහු රජ සමයේ ඉදි වූවකි.
- ධර්මකීර්ති හිමියන්ගේ අනුශාසනා පරිදි සේනාධිලංකාර ඇමතිගේ මූලිකත්වයෙන් විහාරයේ කටයුතු සිදු කර ඇත.
- මෙහි ගෘහ නිර්මාණ ශිල්පියා ලෙස කටයුතු කරන ලද්දේ දකුණු ඉන්දීය ශිල්පියෙකු වන ගනේෂ්වරාචාර්ය හා ඔහුගේ අනුගාමික ශිල්පීන් ය.

**වාස්තුවිද්‍යා නිර්මාණ**

- මෙය තනි කළු ගලෙන් නිමවා ඇති අතර ගොඩනැගිල්ල, මණ්ඩපය, අන්තරාලය හා ගර්භ ගෘහය යන ප්‍රධාන කොටස් තුනකින් යුක්ත ය.
- විහාරයේ මණ්ඩපය තනි කළු ගලෙන් නිමවා ඇති අතර පියස්ස පැතලි ය.
- එහි පාදමේ ජීව ශක්තියෙන් හා චලනයෙන් යුත් නටන්නන් හා වයන්නන්ගේ රූප පෙළක් කැටයම් කර ඇත.
- දොරටුව ඉදිරිපස දෙකෙළවර සිව්රැස්, අටැස් කොන් සහිත තුන් ඇඳුතු ගල්කුළුණු ය.
- දාගැබක හැඩය ඇති “ගෙඩිගෙය” නම් වෘත්තාකාර ශිඛරයක් සහිත පියස්සකි.
- මෙම ලක්ෂණ හේතුවෙන් මෙම බෞද්ධ විහාරය දකුණු ඉන්දීය විජයනගර් ගෘහ නිර්මාණ ලක්ෂණ ප්‍රකට කරන බව පෙන්ව යි.
- තුන් ඇඳුතු කුළුණු පාදමේ හිස ඔසවාගත් සිංහ රුවක් ද, දකුණු හිසේ තවත් සිංහ රුවක් ද, දකුණු බඳේ වෘෂභයෙකු පිට නැගි මිනිස් රුවක් හා මාළුවෙකු පිට නැගි මිනිස් රුවක් කැටයම් කර ඇත.
- විශාල කුළුණට කුඩා කුළුණු සම්බන්ධ කිරීම සඳහා ගල් පටියක් සම්බන්ධ කර ඇත.

**විජයෝත්පාය**

- ගඩලාදෙණි විහාරය ඉදිරිපස නිමවා ඇති විජයනගර් සම්ප්‍රදායට අයත් ගෘහ නිර්මාණයකි.
- අඩි 12ක් පමණ උස අධිතාලමක් මත හිඳි බුද්ධ ප්‍රතිමා 4ක් තැන්පත් කර ඇති ගලින් නිම වූ ප්‍රතිමා ගෘහ 4කි.
- මෙම ගෘහ නිර්මාණ අංගයේ දිසා අටකට මුහුණලා ඇත් රූප 8ක් කැටයම් කර ඇත.
- ගොඩනැගිල්ල මධ්‍යයේ අඩි 4ක් පමණ උස් වූ ස්ථූපය පියස්සකින් ආවරණය වේ.
- ස්තූපය වටා ඇති කුඩා පරිවාර චෛත්‍ය සතරකි. ඒවා ප්‍රතිමාගෘහ හතරේ පියස්ස මත ඉදි කර ඇත.

**මූර්ති නිර්මාණ (බුද්ධ ප්‍රතිමා)**

- ගර්භගෘහය තුළ මහනුවර යුගයේ ප්‍රතිමා ලක්ෂණ පිළිබිඹු කරන හිඳි බුදු පිළිමයක් හා හිටි බුදු පිළිම 4කි.
- මේවා විවෘත දෙනෙත්, තරංගාකාර රැලි සහිත චීවරයෙන් යුක්ත වන අතර බුදුන්ගේ අධ්‍යාත්මික ගුණ සමුදායට වඩා බාහිර ලක්ෂණ පෙන්ව යි.
- පිළිමය පිටුපස වර්ණ ගන්වන ලද අලංකාර මකර තොරණකි.
- හිඳි පිළිමයේ වීරාසන ක්‍රමය ධ්‍යාන මුද්‍රාවෙන් යුක්ත වන අතර හිස මත සිරස් පතකි.

ඇගයීම

1. ගඩලාදෙණි විහාරයේ දැකිය හැකි වාස්තු විද්‍යා අංග හා මූර්ති නම් කරන්න.
2. විහාරයේ යුගය, අනුග්‍රහය, ශිල්පියා, ඓතිහාසික පසුබිම කෙටියෙන් ලියන්න.
3. වාස්තුවිද්‍යා නිර්මාණ අයත් සම්ප්‍රදායයන්, මාධ්‍ය, ශිල්ප ක්‍රම නම් කරන්න.
4. ගඩලාදෙණි විහාරයේ බුදු පිළිමයෙහි මුද්‍රා, ආසන ක්‍රම, සිවුර, භාව ප්‍රකාශනය හා සම්ප්‍රදාය නම් කරන්න.